267

චක්‍ර ලේඛ අංක -12/2023

මගේ අංකය -සමු/මෙ/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප)
තැ.පෙ.444, ආදිපාද වීදිය,
කොළඹ 01
2023.11. 13

සීමාසහිත කොළඹ දකුණ සමුපකාර සමිතියේ සහ

සියළුම සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

## විවිධ සේවා සමුපකාර සමිතිවල පාරිභෝගික අංශ පවත්වාගෙන යාම.

විවිධ සේවා සමුපකාර සමිති, විවිධ වූ සේවා අංශ සහිතව පවත්වාගෙන යාම අරමුණු කරමින් බිහිකරන ලද සමුපකාර සමිති විශේෂයක් වේ. එම සමිති ආරම්භක අවධියේ ප්‍රමුඛ අංශය ලෙස පාරිභෝගික අංශය ක්‍රියාත්මක වී ඇත.

රාජ්‍ය සහනාධාර පොදු මහජනතාවට සාධාරණව හා අඛණ්ඩව බෙදාහැරීමේ නියෝජිතයා වශයෙන් විවිධ සේවා සමුපකාර සමිති මුල් අවධියේ සුවිශේෂී මෙහෙවරක් ඉටුකර ඇත. කාලයත් සමග ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලන පරිසරයේ සිදු වූ වෙනස්කම් අනුව විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තිය බවට පත්විය. මේ සමගම රජයේ සහනාධාර බෙදාහරින්නා ලෙස සමුපකාරයට තිබූ වැදගත්කම ක්‍රමයෙන් අඩුවන්නට විය. රාජ්‍ය ආධාර බොහෝදුරට දුගී ජනතාවට සීමා වූ අතර ඔවුන් වෙත රාජ්‍ය ප්‍රතිලාභ ලබා දීම සඳහා සමෘද්ධි බැංකු ඇතුළු නව ව්‍යුහයන් නිර්මාණය වන්නට විය. ඒ අනුව ජනතාවට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාහැරීමේ නියෝජිතයා වශයෙන් සමුපකාර අංශයේ වැදගත්කම තවදුරටත් අඩු විය.

මෙම පසුබිම තුළ ඇතැම් සමුපකාර සමිති තම වෙළඳපල ප්‍රතිපත්ති සංශෝධනය කරමින් තරගකාරී ව්‍යාපාරික ප්‍රජාව සමග තරග කරමින් සාමාජීය අලෙවිකරණ ප්‍රවේශයන්ට නැඹුරු වෙමින් සාර්ථක තරගකාරී පාරිභෝගික ව්‍යාපාරික ඒකක ගොඩනගා ගැනීමට සමත් විය. නමුත් බහුතරයක් සමුපකාර සමිතිවලට ඉහත පරිදි සුබවාදී වෙනසක් ඇතිකර ගැනීමට නොහැකි වීම තුළ දිගින් දිගටම පාරිභෝගික අංශ අලාභ ලබන්නට විය.

අලාභ වශයෙන් අභ්‍යන්තර අරමුදල් බාහිරට අවාසි සහගත ලෙස ගලායාම නිසා මෙම අංශයේ කාරක ප්‍රාග්ධන ඌණතා ඇතිවීම සුලබ කාරණයක් වී ඇත. මෙම කාරක ප්‍රාග්ධන ඌණතාවය පියවා ගැනීම සඳහා මෙම සමිතිවල ක්‍රියාත්මක ග්‍රාමීය බැංකු අංශයේ අරමුදල් නීත්‍යානුකූල නොවන අයුරින් භාවිත කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. පොදු මහජන තැන්පත්වලින් අරමුදල් සම්පාදනය කර ඇති ග්‍රාමීය බැංකු අංශයේ අරමුදල් මේ අයුරින් භාවිත කිරීම නිසා ඇතැම් සමිතිවල මහජන තැන්පත් බරපතල ලෙස අවදානමට ලක් වී ඇත. මේ වනවිට ඇතැම් සමිතිවලට තැන්පත් ආපසු ගෙවීමට නොහැකි වී ඇත.

තවදුරටත් මේ අයුරින් අලාභ ලබන පාරිභෝගික අංශ නඩත්තු කිරීම සඳහා මහජන තැන්පත් භාවිත කිරීම, සමස්ත සමුපකාර පද්ධතියේම බරපතල බිඳවැටීමකට හේතුවනු ඇත. එමනිසා මෙම පසුබිම වෙනස් කර ගැනීම සඳහා අලාභ සහිතව පවත්වාගෙන යනු ලබන පාරිභෝගික අංශ හා අනෙකුත් අංශ සම්බන්ධයෙන් කඩිනමින් පියවර ගත යුතුව ඇත. ඒ සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරවමි.

සමුපකාර සමිතිවල අලාභ ලබන පාරිභෝගික හා අනෙකුත් අංශවල වර්තමාන තත්ත්වය පිළිබඳව එම සමිතිය විසින්ම වහාම විශ්ලේෂණය කළ යුතුයි. ඒ අනුව, මෙම අංශය මේ අයුරින්ම සංවර්ධනය කිරීමට හැකියාවක් තිබේ ද යන්න හෝ මෙම අංශය නවාකරණයකට ලක්කරමින් නැතහොත් විවිධාංගීකරණයට ලක්කිරීමෙන් පවත්වාගෙන යාමට හැකියාවක් තිබේ ද යන්න හඳුනාගත යුතුය. යම් අයුරකින් ඉහත දැක් වූ විකල්ප දෙකම අනුගමනය කළ නොහැකි නම් වහාම මෙම අංශය වසා දැමීමට පියවර ගත යුතුය. මෙහිදී සමස්ත අංශය වසා දැමීම වෙනුවට ඇතැම් ව්‍යාපාරික ඒකක වසා දැමීමට හෝ නවීකරණය කළ හැකි ව්‍යාපාර ඒකක ඒ අයුරින් පවත්වාගෙන යාමටත් කටයුතු කළ හැකිය. නමුත් ඒ සඳහා විධිමත් අධ්‍යයනයක් සිදුකර නිශ්චිතව හඳුනාගැනීම සිදුකළ යුතුය.

ඉදිරි මාස හයක කාලය ඇතුළත පාරිභෝගික අංශය පවත්වාගෙන යාම, සංකෝචනය කර පවත්වාගෙන යාම, නවීකරණය කර හෝ විවිධාංගීකරණය කර පවත්වාගෙන යාම හෝ වසා දැමීම පිළිබඳව තීරණ ගත යුතු බව අවධාරණය කරමි.

ඉහත පරිදි අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ලාභදායී තත්ත්වයට පත්කර ගත නොහැකිව තවදුරටත් අලාභ ලබන පාරිභෝගික අංශ හෝ පාරිභෝගික අංශ වෙළඳ ඒකක හෝ වෙනත් අංශ නඩත්තු කිරීම සඳහා කිසිසේත් මහජන තැන්පත් භාවිත නොකළ යුතු බවත් අලාභ ලබන පාරිභෝගික අංශ හෝ පාරිභෝගික අංශ වෙළඳ ඒකක හෝ වෙනත් අංශ පවත්වාගෙන යාම සඳහා බැංකු ඇතුළු මූල්‍ය ආයතනවලින් ණය පහසුකම් ලබා නොගත යුතු බවත් මෙබඳු නඩත්තු කටයුතු සඳහා විවිධ නාමයන් යොදවා (පාරිභෝගික තැන්පත් ආදී) මහජන මුදල් එක්රැස් නොකළ යුතු බවත් ග්‍රාමීය බැංකු අංශය ගොඩනැඟී ඇති අතිරික්ත මුදල් මෙබඳු නඩත්තු කටයුතු සඳහා භාවිත නොකළ යුතු බවත් දැඩිව අවධාරණය කරමි.

මෙම විධිවිධාන උල්ලංඝණය කරමින් කටයුතු කිරීම නිසා සමිතියට සිදුවන අලාභයකට හා පාඩුවකට හෝ සමිතිය යටත්වන දඩුවමකට අධ්‍යක්ෂ මණ්ඩලය හා සේවකයන් තනිතනිව හා සාමූහිකව වගකීමට බැඳෙන බවත් එබඳු අවස්ථාවක සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58 වගන්තිය යටතේ ක්‍රියා කිරීමට සිදුවන බවත් වැඩිදුරටත් දන්වමි.

එම්.ඒ.පී.ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
බස්නාහිර පළාත

පිටපත් :-

01. ලේකම්, සමුපකාර හා ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප) - කරු.දැ.පි

02. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) - කරු.දැ.පි. සහ සමිතිවලට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම සඳහා

03. ප්‍රධාන කාර්යාලයේ සියළුම දිස්ත්‍රික් නිලධාරීන් - කරු.දැ.පි. සහ සමිතිවලට උපදෙස් හා මගපෙන්වීම් ලබා දීම සඳහා

04. ප්‍රධාන කාර්යාලය, සියළුම මූලස්ථාන පරීක්ෂකවරු - කරු.දැ.පි. සහ සමිතිවලට උපදෙස් හා මගපෙන්වීම් ලබා දීම සඳහා